

RESOURCE PACK

# THE CERTIFICATE

*රටක් නැතිකම ගැන තනියම කියන කතාවක්*

රුවන්ති ද චිකේරාගේ
නාට්‍ය රචනයක්

**පාර්ශවකරුවෝ**

Institute on Statelessness and Inclusion
Empathy and Risk සංවිධානය
UNHCR – Sri Lanka (සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය)

stages
theatre
group

සියලුම හිමිකම් ඇවිරිණි. ප්‍රකාශකයාගේ ලිඛිත අවසරයෙන් තොරව මෙම ප්‍රකාශනයේ කිසිඳු කොටසක් නැවත සකස් කිරීම හෝ වෙනත් පිටකවරයකින් පළ කිරීම හෝ ප්‍රකාශයට පත් කර ඇති තත්වයෙන් හෝ තත්වයට වඩා වෙනස් ආකාරයකින් ප්‍රකාශයට පත් කිරීම හෝ සපුරා තහනම්.

**අධ්‍යයන ගොනුව**

**The Certificate**

පළමු ප්‍රකාශනය (අන්තර්ජාල/ e - ප්‍රකාශන) 2020
© 2020 ස්ටේජස් නාට්‍ය කණ්ඩායම
ISBN 978-624-5487-36-3

RESOURCE PACK

# THE CERTIFICATE

*රටක් නැතිකම ගැන තනියම කියන කතාවක්*

රුවන්ති ද චිකේරාගේ
නාට්‍ය රචනයක්

---

පාර්ශවකරුවෝ

Institute on Statelessness and Inclusion
Empathy and Risk සංවිධානය
UNHCR – Sri Lanka (සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය)

The Certificate කියන්නේ ළමයෙක් ගැන කියවෙන නාට්‍යයක්. මේ නාට්‍යය ඉදිරිපත් කරන්නෙත් දරුවෙක්. රටක් නැතිකම වැඩිහිටියෝ ඇති කරපු ප්‍රශ්නයක්. ඒත් හුඟක් ළමයි මේ ප්‍රශ්නය නිසා පීඩාවට පත්වෙලා ඉන්නවා. ඒ නිසා මේ අධ්‍යයන ගොනුව ලිව්වේ වැඩිහිටියන් සහ ළමයි කියන දෙපාර්ශවයම ඉලක්ක කරගෙන.



*මේ අධ්‍යයන ගොනුව කොටස් තුනකට වෙන් කර තිබෙනවා. ඔබට මේ කොටස් තුනම එක සේ ප්‍රයෝජනවත් වෙයි කියලා අපි අපේක්ෂා කරනවා.*

## ගැටලුව – රටක් නැතිකම

මේ අධ්‍යයන ගොනුවෙන්- නාට්‍යක් හරහා සාකච්ඡා වෙන්නේ ගෝලීය මට්ටමේ අර්බුදයක් ගැනයි. ඒ රටක් නැතිකමේ ගැටලුව.මේ අධයයන ගොනුවේ මුල් කොටස රටක් නැතිකමේ ගැටලුව ගැනත්, ඊට මැදිවුණු මිනිස්සු ගැනත්, මේ ගැටලුවට විසඳුම් සොයන්න වෙහෙසෙන අය ගැනත් වැඩිදුරටත් දැනුවත් වෙන්න ඔබට උපකාරී වේවි.

## නාට්‍යය – THE CERTIFICATE

The Certificate කියන්නේ දරුවෙකුගේ දෘෂ්ටි කෝණයෙන් රටක් නැති කම ගැන සාකච්ඡා කරන ඒක භාෂික නාට්‍යයක්. අධ්‍යයන ගොනුවේ මේ පරිච්ඡේදය කියවීමෙන් ඔබට  මේ නාට්‍යය බිහිවුණු හැටිත්, එය ක්‍රමයෙන් ගොඩනැගුණු හැටිත් අවබෝධ කරගන්න පුළුවන්.

## මැදිහත්වීමක් – සමාජ ක්‍රියාකාරීත්වය සහ කලාව

The Certificate කියන්නේ හුදෙක් රඟදැක්වීමක් විතරක්ම නෙවෙයි. එහි මූලිකම අරමුණ ප්‍රේක්ෂක පිරිස කළඹා ඔවුන්වත් සමාජ ක්‍රියාකාරීත්වය වෙත යොමු කිරීමයි. අධ්‍යයන ගොනුවේ මේ කොටසින් පෙන්වා දෙන්නේ රටක් නැතිකමේ ගැටලුව පිළිබඳ සංවාදයට කලාව දායකවන ආකාරය පිළිබඳවයි..

# පටුන

## ගැටලුව - රටක් නැතිකම


රටක් නැතිකම කියන්නෙ මොකද්ද? 5
රටක් නැති මිනිස්සු 7
රටක් නැතිකම ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ 8


## නාට්‍යය - THE CERTIFICATE


The Certificate කියන්නේ මොකද්ද? 11
මේ නාට්‍යයේ ඉතිහාස කතාව 12
මෙහෙම නාට්‍යයක් ගොඩනැගුවේ ඇයි? 16
පිටපත් රචක රුවන්ති ද චිකේරා දැක්වූ අදහස්
The Certificate වෙත හිමිවුණු ප්‍රතිචාර 19


## මැදිහත්වීම - සමාජ ක්‍රියාකාරීත්වය සහ කලාව


කලාව හා සමාජ ක්‍රියාකාරීත්වය අතර තිබෙන සම්බන්ධය 21
The Certificate රංගයක සිට බාධා කිරීමක් දක්වා 22
බාධා කිරීමක් ලෙස The Certificate ඉදිරිපත් කිරීම ගැන පළ වූ අදහස් 26
රටක් නැතිකමේ ගැටලුව සම්බන්ධයෙන් ක්‍රියාකාරී වූ කලාකරුවන් 28

# ගැටලුව

## රටක් නැතිකම






**රොහිංගියා ජනතාව**
*reuters.com*

# රටක් නැතිකම කියන්නේ මොකක්ද ?

රටක් නැති පුද්ගලයෙකුට පුරවැසිභාවය අහිමියි. තව විදියකින් කියනවා නම් රටක පුරවැසියකු වීමෙන් හිමිවන මූලික අයිතිවාසිකම් - ඡන්දය භාවිත කිරීමේ අයිතිය, ඉඩකඩම්වලට හිමිකම් කීමේ අයිතිය, අධ්‍යාපනය ලැබීමේ අයිතිය, සෞඛ්‍ය සේවා ලැබීමේ අයිතිය, ගමනාගමනයට ඇති අයිතිය, නීතිය සහ රාජ්‍ය මගින් රැකවරණය ලැබීමේ අයිතිය, විවාහ වීමටත්, දරුවන්ට පුරවැසිභාවය ලබාදීමටත් ඇති අයිතිය... වගේ පුරවැසිභාවය හිමි පුද්ගලයන්ට පිරිනැමෙන අයිතීන් කිසිවක් "රටක් නැති" පුද්ගලයකුට හිමි වෙන්නේ නැහැ.

ජාතිකත්වයකට හිමිකම් කීම ඕනෑම මනුෂ්‍යයෙකුගේ මූලික අයිතියක් බවට ලොවම පිළිගත්තත්, ලෝකයේ අදටත් මිලියන 10ත් 15ත් අතර පිරිසකට රටක් අහිමියි. මේ යොමුවෙන් පුද්ගලයෙකුට පුරවැසිභාවයකට හිමිකම් කීමට ඇති මූලික අයිතිය ගැන අවබෝධ කරගන්න.

රටක් නැතිකමේ ගැටලුව ගැන වැඩිදුරටත් දැනුවත් වෙන්න Institute on Statelessness and Inclusion ආයතනයේ වෙබ් අඩවියට පිවිසෙන්න.




ඔබ රටක් නැතිකම ගැන දැනුවත් වෙන්න කැමති දරුවෙක් නම් මේ ගැන ලියවුණු ළමා පොතක් කියවන්න ඔබ වඩාත් කැමති වේවි – Finding Neha

# රටක් නැති මිනිස්සු

නිල සංඛ්‍යාලේඛනවලට අනුව ලෝකයේ වෙසෙන රටක් නැති මිනිස්සුන්ගේ සංඛ්‍යාව මිලියන 10ක්. නමුත් සමාජ ක්‍රියාකාරීන්ට අනුව නම් ඒ සංඛ්‍යාව මිලියන 15කට ආසන්නයි.

## රටක් නැතිකම සම්බන්ධ ගැටලු

පුද්ගලයෙක්, උපතින් හෝ කාන්තාවන්ට බලපාන අසාධාරණ නීති, ස්වාභාවික ආපදා, දේශපාලන අස්ථාවරභාවය සහ යුද්ධ, මිනිස් ප්‍රජාවන් සහමුලින්ම විනාශ කරදැමීමේ අරමුණින් ගන්නා ක්‍රියාමාර්ග, පෞද්ගලික හෝ දේශපාලනික ගැටලුවකින් වින්දිතභාවයට පත්වීම වැනි කරුණු නිසා රටක් නැති තත්වයට පත් වෙන්න පුළුවන්. රටක් නැතිකමත් මව්පියන්ගෙන් උරුම විය හැකි නිසා ලෝකයේ රටක් නැති දරුවෝ විශාල සංඛ්‍යාවක් ඉන්නවා.

*Institute on Statelessness and Inclusion ආයතනයේ සම අධ්‍යක්ෂ අමල් ද චිකේරා රටක් නැතිකම ගැන ස්ටේජස් නාට්‍ය කණ්ඩායම සමඟ පළකළ අදහස්වලට සවන් දෙන්න.*

## රටක් නැති ජනතාව

රටක් නැතිකම තනි පුද්ගලයන්ට වගේම මිනිස් සමූහයන් මුහුණ දෙන ගැටලුවක්. ඉතිහාසය පුරාවටම සමහර ජාතීන් සහ ඇතැම් ආගම් අදහන පිරිස් ඉලක්ක කරගෙන පහර ගැසුවේ ඔවුන්ගේ ජීවත් වීමේ අයිතිය සහ අනන්‍යතාවය අහෝසි වී යන ආකාරයටයි. මේ යොමුවෙන් ඉතිහාසය පුරාවට රටක් නැති වීමේ ඉරණමට ගොදුරු වුණු පිරිස් ගැන වැඩිදුරටත් දැනුවත් වෙන්න.

## රටක් නැතිකම සහ කාන්තාවන්

කාන්තාවන්ට පමණක් බලපාන අසාධාරණ නීතිත් රටක් නැතිකමට හේතු වන මූලිකම සාධකයක්. ලෝකයේ සමහර රටවල් අදටත් තම පුරවැසිභාවය දරුවන්ට උරුම කරදෙන්න කාන්තාවන්ට අවස්ථාව ලබාදෙන්නේ නැහැ- ඒ නිසාම උපතින්ම රටක් අහිමි දරුවෝ ගොඩක් ලෝකයට බිහි වෙනවා.

*තමාටත්, තම දියණියන් දෙදෙනාටත් පුරවැසිභාවය ලබාගැනීම සඳහා වසර ගණනක් තිස්සේ සටන් කළ, කලකට පෙර රටක් නැති ස්ත්‍රියක වූ දීප්ති ගුරුන්ග්, රටක් නැතිකමට එරෙහිව ඇයගේ ක්‍රියාකාරීත්වය ගැන පළකළ අදහස්.*

# රටක් නැතිකම ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ

*ශ්‍රී ලංකාවට රටක් නැතිකම සම්බන්ධ දිග ඉතිහාසයක් තිබෙන බව ඔබ දැනගෙන සිටියාද? ඒ පිළිබඳ මූලික පසුබිම් තොරතුරු ටිකක් මෙතන සඳහන් කරලා තියනවා. මේ ගැන වැඩිදුරටත් තොරතුරු රැස් කරන්න ඔබ පෙළඹේවි කියලා අපි අපේක්ෂා කරනවා.*

## ලංකාවේ ජීවත්වන රටක් නැති මිනිස්සු

ශ්‍රී ලංකාව, බ්‍රිතාන්‍ය යටත් විජිතයක්ව පැවතුණු කාලයේ, තේ, කෝපි සහ පොල් වතුවල සේවයට තමිල්නාඩුවේ දෙමළ ජාතිකයන් බඳවාගත්තා.

ඔවුන්ව නොකඩවා සේවයට බඳවාගැනීමත්, ජනගහණය ශීඝ්‍රයෙන් ඉහළ යෑමත් නිසා, 1921 වසර වෙද්දී, පොදුවේ වතුකර දෙමළ ප්‍රජාව නමින් හැඳින්වෙන මේ පිරිස රටේ සමස්ත ජනගහනයෙන් සියයට 13.5ක් (602,700) වුණා. 1936 වෙද්දී මේ සංඛ්‍යාවත්, ප්‍රතිශතයත් තවත් ඉහළ ගිහින් තිබුණා. දැන් වතුකර දෙමළ ප්‍රජාව 1,123,000ක්, නැතිනම් රටේ සමස්ත ජනගහණයෙන් සියයට 15.3ක්. ඒ අතරින් බහුතරයක් ශ්‍රී ලංකාවේ පුරවැසියන් නෙවෙයි. ඔවුන් ඉන්දියාවටවත්, ලංකාවටත් අයිති නැති පිරිසක්. සිංහල සමාජයේ සමහර පිරිස් දෙමළ ජාතිකයන්ගේ ගහණය වැඩිවීම ගැටලුවක් ලෙස දකිමින් ඔවුන්ව නැවතත් ඉන්දියාවට යවන්න කියලා රජයට බලපෑම් කළා. ඒ නිසාම 1948දී ශ්‍රී ලංකාවට නිදහස ලැබීමත් සමගම රජය ලංකා පුරවැසි පනත හඳුන්වා දුන්නා.

මේ පනත වතුකර දෙමළ ප්‍රජාවෙහි 5,000කට පමණ පුරවැසිභාවය ලබාදුන්නා. නමුත්, 70,000ක ආසන්න පිරිසකට (11%ක්) ලංකාවේ පුරවැසිභාවය අහිමිවුණා.



***Echoing Hills (2018)***
*කිං රත්නම්ගේ වාර්තාමය චිත්‍රපටයක්*

තමන්ගේ පවුල් සහ තමා මෙතෙක් කල් මව්බිම හැටියට සැලකූ භූමිය අත්හැර යෑමට සිදු වුණු ජනතාව මහ හඬින් හඬා වැලපෙද්දී දුම්රියපොළට ආපු දුම්රියේ හඬත් යටපත් වුණු බව සඳහන් වෙනවා. මේ සිදුවීම දෙමළ භාෂාවෙන් හැඳින්වෙන්නේ "ඔප්පාරි කෝච්චි" නමින්. එහි සිංහල තේරුම "වැළපෙන දුම්රිය".

***"වැළපෙන දුම්රිය" චිත්‍රපටිය බලන්න***

ඊළඟ වසර කිහිපය තුළ මේ ගැටලුවට විසඳුමක් සපයන්න ශ්‍රී ලංකාවේත්, ඉන්දියාවේත් රජයන් අසමත් වුණා. ඉන්දු-ලංකා පුරවැසි පනත (1949) ඊට විසඳුමක් ලබාදුන්නේ නැහැ; 1954 නේරු-කොතලාවල ගිවිසුමත් මේ ගැටලුව නිසියාකාරයෙන් විසඳන්න අසමත් වුණා. 1962 වර්ෂය වෙද්දී මේ රටවල් දෙක අතරට මැදි වුණු පිරිස 975,000කට ආසන්න වුණා- ශ්‍රී ලාංකිකයන් ඔවුන් ඉන්දියානුවන් ලෙසින් හංවඩු ගහද්දී, ඉන්දියාව ඔවුන් සැලකුවේ රටක් නැති අය හැටියටයි.

***මතුකරයේ දෙමළ ප්‍රජාවේ ඉතිහාසයත්, ඔවුන්ගේ කතන්දරයත් පිළිබඳව වැඩිදුර තොරතුරු දැනගන්න.***

# නාට්‍යය
# THE CERTIFICATE



# THE CERTIFICATE කියන්නේ මොකද්ද ?

*The Certificate* කියන්නේ රටක් නැති දරුවෙක් ඉදිරිපත් කරන කෙටි ඒක භාෂික නාට්‍යයක්. මේ නාට්‍යය පුද්ගලයෙක් “රටක් නැති මනුෂ්‍යයකු“ හැටියට නම් කිරීමේ මූලික සංකල්පයම අභියෝගයට ලක්කරනවා. *The Certificate* මිනිත්තු 15ක්-20ක් පමණ දිගයි. ඉදිරිපත් කරන්නේ වයස අවුරුදු 13ක 14ක දැරියක්. ඇය ඇයගේම ජීවන අත්දැකීම් හරහා රටක් නැතිකම ගැන ඇයට තිබෙන ගැටලු ප්‍රේක්ෂකාගාරයට සෘජුවම ඉදිරිපත් කරනවා.

*The Certificate* සාම්ප්‍රදායික ආකෘතියෙන් පවා ඉදිරිපත් කරන්න පුළුවන් වුණත් විශේෂ සැමරුමක් අතරතුර හදිසි මැදිහත් වීමක් හැටියට එය ඉදිරිපත් කිරීම වඩාත් ප්‍රතිඵලදායකයි. තව විදියකින් කියනවා නම් මේ ඉදිරිපත් කිරීම රඟපෑමක්ද යථාර්ථයද කියලා තෝරා බේරාගැනීම අසීරු වන තරමට *The Certificate* සාර්ථකයි.

නමුත් අපි මුලින්ම මේ නාට්‍යය ගැන ටිකක් සමීපව විපරම් කරමු...



# මේ නාට්‍යයේ ඉතිහාස කතාව

*අපි මොහොතකට හිතමු... මේ පුංචි නාට්‍යයටත් (මේ නාට්‍යය බොහොම කෙටි නාට්‍යයක්) රටක් නැත්නම්... එහෙම වුණොත් මේ නාට්‍යයේ කතාව මොන විදියේ එකක් වේවිද?*

*The Certificate* නාට්‍යයට තියෙන්නේ වසර කිහිපයක ඉතිහාසයක්. මේ නාට්‍යය බිහිවුණේ 2017 ජනවාරි මාසයේ සීතල දවසක. මේ ඒක භාෂික නාට්‍යයේ උප්පත්තිය ඇහින් දැකපු විශාල පිරිසක් හිටියා. නමුත් සමහරුන්ට නම් ඒ බව අමතක ඇති.

ඒ Institute on Statelessness and Inclusion ආයතනය මගින් ප්‍රකාශයට පත්කළ 'The World's Stateless' කියන වාර්තාව එළිදැක්වීමේ උළෙලට සහභාගී වුණු පිරිස. මේ පොත් එළිදැක්වීම වැදගත් වුණේ රටක් නැති දරුවන්ගේ ගැටලුව වගකිවයුත්තන්ගේ අවධානයට යොමු කිරීමත්, බලමුළුගැන්වීම, සමාජ ක්‍රියාකාරීත්වය සහ නීතිමය ක්‍රියාමාර්ග හරහා කඩිනමින් විසඳුම් සැපයීමට බලධාරීන් පෙළඹවීමත් අරමුණු කරගෙන සංවිධානය කළ නිසයි. මේ අවස්ථාවට විශාල පිරිසක් සහභාගී වුණා වගේම සමාජයට බලපෑම් කළ හැකි තනි පුද්ගලයන් සහ සංවිධානවල නියෝජිතයන් - මෙලනි කැනා (UNHCR), කැතරින් හැරින්ටන් (Global Campaign for Equal Nationality Rights), ලෝරා බින්හම් (Open Society Justice Initiative) යනාදීන් මේ අවස්ථාවට එක් වුණා.

*The Certificate* බිහිවුණු මොහොතේ කාටවත් ඒ අවස්ථාව ඡායාරූපගත කරන්න මතක් වුණේ නැහැ. නමුත් එක පුද්ගලයෙකුට ඒ දර්ශනය ජංගම දුරකථනයේ කැමරාවෙන් පටිගත කරන්න තරම් සිහි බුද්ධිය තිබුණා. ඉතින් ඒ උප්පත්තිය ගැන සාක්ෂි මෙතැනින් නරඹන්න පුළුවන්. ඒ සාක්ෂි පැවතීම ගැන අපි බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

*The Certificate* මුල්ම වරට රඟදැක්වුවේ කදිජා බද්‍රි කියන ශිෂ්‍ය ක්‍රියාකාරිනිය. ඇගේ රඟපෑම නැරඹූ බොහෝ දෙනෙක් *The Certificate* රටක් නැතිකම සම්බන්ධයෙන් ඉතාමත් වැදගත් ප්‍රශ්න රැසක් ඉස්මතු කළ බව කියා සිටියා.

නමුත් ඒ උත්සවය අවසන් වෙලා කෙටි කාලයක් ගෙවෙද්දී *The Certificate* තාවකාලිකව මතකයෙන් මැකිලා ගියා. **එහෙම නාට්‍යයක් තිබිලාම නැහැ වගේ.**

* * *

ජූනි මාසයේ උණුසුම් දවසක *The Certificate* නැවතත් උපත ලැබුවේ ලෝකයේ එහා කෙළවරේ තියන පුංචි රටක. ඒ රටේ නම ශ්‍රී ලංකාව. මේ වතාවේ නම් සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) මේ උපත ගැන දැනුවත්ව සිටියා වගේම වෙලාවත් සටහන් කර ගත්තා.

ශ්‍රී ලංකාවේදී *The Certificate* කරළියට ආවේ ලෝක සරණාගත දිනයට සමගාමීවයි. මේ දවස තුළදී සරණාගතයන්ට අදාළ ගැටලු ගණනාවක්ම සාකච්ඡාවට ලක් වුණත් *The Certificate* රටක් නැතිකමට අදාළ සුවිශේෂී ගැටලු ගැන මිනිසුන්ගේ අවධානය යොමු කළා. ඒ ගැටලු සරණාගතයන් මුහුණපාන ගැටලුවලට වඩා වෙනස්. මෙවර *The Certificate* ඉදිරිපත් කළේ කදිජාටත් වඩා ලාබාල ශාලිනා මුතුමුදලිගේ. ශාලිනා *The Certificate* ඉදිරිපත් කරනවා නරඹපු වැඩිහිටියෝ මේ තරම් සංකීර්ණ, වැඩිහිටියන්ට අදාල ගැටලුවක් ගැන පුංචි දැරියකට තිබුණු අවබෝධය ගැන පුදුමයටත්, සතුටටත් පත් වුණා.

නමුත්, *The Certificate* නාට්‍යයට නිසි පිළිගැනීමක් ලබාදෙන්න සමහරු විශාල වෙහෙසක් දැරුවත්, කිහිප වතාවක් උත්සහ කළත්, *The Certificate* ආයෙමත් අභාවයට ගියේ එහෙම නාට්‍යයක් කිසි කාලයක නොතිබුණා වගේ.

* * *

ඊට අවුරුදු දෙකකට පස්සේ 2019 ජූනි මාසයේදී, *The Certificate* අනපේක්ෂිත විදියට ප්‍රසිද්ධියේ කලඑළි බැස්සේ නෙදර්ලන්තයේ හේග් (Hague) නගරයේදියි. ඒ පුරවැසිභාවය අහිමි වීම ගැන පැවැත්වුණු මුල්ම ලෝක සමුළුවේදියි. එය සංවිධානය කළේ Institute on Statelessness and Inclusion ආයතනය මගින්. The Certificate ඉදිරිපත් කළේ Empathy and Risk සංවිධානයේ අනුග්‍රහයෙන් පැවැත්වුණු CANCELLED කලා උලෙළ අතරතුරයි.

CANCELLED කලා උලෙළ කලාකරුවන් අතින් සංවිධානය වුණේ පුරවැසිභාවය අහිමි වීම පිළිබඳ ලෝක සමුළුව විමසුමට සහ අභියෝගයට ලක් කිරීමේ අරමුණින්. සමුළුවේ සමාරම්භක උලෙළේදී ප්‍රධාන කථිකයා වුණු රාධිකා කුමාරස්වාමිගේ කතාව නිමා වුණු සැණින් *The Certificate* රැස් වී සිටි 250ක පිරිසට ප්‍රශ්න ඉදිරිපත් කරමින් උත්සවයේ වැඩ පිළිවෙළට අවහිර කළා.

# C–NC–LL–D

සමාරම්භක උලෙළට සහභාගී වුණු පිරිස *The Certificate* ඇති කළ බාධාව ගැන අන්දමන්ද වුණා. ඔවුන් එය අපේක්ෂාවෙන් සිටියේ නැහැ. ඔවුන් *The Certificate* රඟදැක්වීමක්ද නැත්නම් සැබෑ සිදුවීමක්ද කියලා දැන සිටියේ නැහැ. සමහරු ඒ උලෙළෙන් පසුවත් *The Certificate* කියන්නේ රඟදැක්වීමක් බව පිළිගත්තේ නැහැ.

ඉතින් මේ වතාවේ විශාල පිරිසක් *The Certificate* නැරඹුවත්, එහි පැවැත්ම ගැන තිබුණු සැක සංකා සම්පූර්ණයෙන්ම දුරස් වුණේ නැහැ.

ඉතින් *The Certificate* කියන පුංචි ඒකභාෂික නාට්‍යයේ කතාව ඒකයි. *The Certificate* විශාල උත්සවයක් අතරමැද, ඊට බාධා කරමින් රඟදක්වන ඒකභාෂික නාට්‍යයක් හැටියට අනන්‍යතාවය ගොඩනගාගත්තේ ඒ වගේ උත්සාහයන් කිහිපයකින් පසුවයි.

නමුත් මේ නාට්‍යයට වස්තු විෂය වුණු මිනිස්සු - රටක් නැති මිනිස්සු ඔවුන්ට පුරවැසිභාවය ලබාදීම ප්‍රතික්ෂේප කරන අතරම, මනුෂ්‍යයෙක් හැටියට පිළිගැනීම සහ සැලකිලි ලබන්න නම් පුරවැසිභාවය අත්‍යාවශ්‍ය බව තරයේම කියා සිටින ක්‍රමවේදයක් නිසා ඔවුන්ගේ පැවැත්මත්, අනන්‍යතාවයත් තහවුරු කරගන්නට නොහැකිව පීඩාවට පත් වී සිටිනවා.











# මෙහෙම නාට්‍යයක් ගොඩනැගුවේ ඇයි ?

**පිටපත් රචක රුවන්ති ද චිකේරා දැක්වූ අදහස්**

මමත් සාමාන්‍යයෙන් කල්පනා කරන්නෙ තමන්ට සමාජය දෙන හැම අනන්‍යතාවයක්ම - (ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ජාතිය, ජාතිකත්වය...) ප්‍රශ්න කිරීමකින් තොරවම භාරගන්න සාමාන්‍ය මිනිස්සු හිතන මතන විදියටමයි. මගේ අනන්‍යතාවය ගොඩනගන රටක් සහ ජාතිකත්වයක් උරුම වීම මම භාරගෙන තිබුණේ ඉබේටම ලැබුණු දෙයක් හැටියටයි. මම මගේ රට ගැන, රාජ්‍යයේ යම් යම් සීමාවල් ගැන මැසිවිලි කිව්වත්, හදිසියේම ජාතිකත්වය නැති වුණොත් දැනෙන හැඟීම මට හිතින් මවාගන්නත් අමාරුයි. මම හිතන්නේ ඒ අත්දැකීමට මුහුණ දෙනකම් කාටවත් ඒ තත්ත්වය අවබෝධ කරගන්න බැරි වේවි.

පුද්ගලයෙක් මේ තත්ත්වයට ඇද වැටුණාම ජාතික රාජ්‍යයක් ගැන සංකල්පය ගෝලීය මට්ටමින් පවා මුල් බැසගෙන තියෙද්දී කෙනෙකුට හිටි හැටියේම පුරවැසිභාවය අහිමි වුණාම ඔවුන් බොහොම ඛේදනීය විදියට, නොසිතූ විරූ හේතු නිසා අසරණ වෙනවා.

මම රටක් නැතිකම කියන ගැටලුව ගැන මුල්ම වරට දැනුවත් වුණේ ඒ ක්ෂේත්‍රයේ වැඩ කරන මගේ සහෝදරයා අමල් හරහා. මම ඒ ගැන කියවන්න පෙළඹුණේ ඔහු මේ ක්ෂේත්‍රය වෘත්තිය විදියට තෝරාගත් නිසයි. මේ ගැටලුව ගැන මුල්ම වරට දැනුවත් වුණාම මම පුදුමයට පත්වුණු හැටි මතකයි. එහෙම දෙයක් වෙන්න පුළුවන්ද? කිසිම රටකට උරුමකම් කියන්න බැරි මිනිස්සු ඉන්නවද? එච්චර ලොකු ගණනක්- මිලියන දහයක්, නැහැ මිලියන දොළහක්, නැහැ, නියම සංඛ්‍යාව මිලියන පහළොවකට කිට්ටුයි. (මේ මිනිස්සු නිරන්තරයෙන්ම නොසලකා හැරෙන නිසා නියම අගය තක්සේරු කරන්න අමාරුයි.) මේ මොහොතෙදිත් මිලියන පහළොවක් ගැහැණු, පිරිමි සහ දරුවන් ජාතිකත්වයකට උරුමකම් කියන්න අයිතිය නැතිව මේ ලෝකයේ ජීවත් වෙනවද? ඔවුන් කිසිම රටක පුරවැසියො නෙවෙයි. මේ මිලියන පහළොවක ජනතාව ඔවුන්ටම කියලා වෙනම රාජ්‍යයක් ගොඩනගාගන්න ඕන කියලා නොකියා කියනවා වගේ.

මම රටක් නැතිකම ගැටලුවක් බව බරපතළ ගෝලීය ගැටලුවක් බව පිළිගත්තාට පස්සේ තවත් අභියෝගයකට මුහුණ දුන්නා. මම හිතුවේ මිනිස්සුන්ට රටක් නැති වෙන්න බලපාන මූලිකම හේතුව දේශපාලන පළිගැනීම්වලට ලක්වීම කියලා. අතීතයේ වගේම වර්තමානයේදිත් මිනිස්සු විශාල

පිරිසකගේ අනන්‍යතාවය උදුරාගෙන, ඔවුන්ගේ මිනිස්භාවය නොතකා සමූලඝාතනය කළ හැටි මම දන්නවා. රෝහිංන්යා ප්‍රජාව, පලස්තීනුවන්, කුර්දිවරුන්, බොස්නියානු සර්බිවරුන් මුහුණ දීපු ඉරණම මම දන්නවා. මිනිස්සු අනිත් මනුෂ්‍යයන්ගේ මානවභාවය අහිමි කරලා විනාශ කරන්නේ මොන තරම් පහත් විදියටද කියලා මම දන්නවා.

මේ තත්ත්වය ඉතාමත් ඛේදනීය වුණත්, කුරිරු, බලයට කෑදර මිනිස්සු, ඒ වගේ උපායමාර්ග සැලසුම් කරලා ක්‍රියාවට නංවන හැටි මට ටිකෙන් ටික අවබෝධ වුණා. ඉතින් මිනිස්සු රටක් නැති තැනට ඇද දැමීමත් ඒ වගේ රුදුරු සැලසුමක එක පිම්මක් හැටියට දකින්න මම අපේක්ෂාවෙන් හිටියා.

නමුත් ලෝකයේ ඉන්න රටක් නැති පිරිස අතරින් බහුතරයක් ඒ ඉරණමට මුහුණ දීලා ඉන්නේ වෛරී දේශපාලන න්‍යාය පත්‍රයක් නිසා නොවෙයි, කාන්තාවන්ට බලපාන අසාධාරණ නීති නිසා කියලා දැනගත්තාම මමත් පුදුමයට පත් වුණා.

මොකද්ද ඒ කතාවෙ තේරුම?

කාන්තාවන්ට තමන්ගේ පුරවැසිභාවය දරුවන්ට උරුම කරන්න බැරි නිසා, උපතින්ම රටක් නැති දරුවන් විශාල පිරිසක් බිහිවෙනවා.

මේ කාරණය නම් මට ඇත්තෙන්ම වටහාගන්න අමාරුයි. මේ යුගයට අනවශ්‍ය ප්‍රශ්නයක් මේ. ඇයි රජයක් හිතාමතාම මිනිස්සුන්ව ජීවිත කාලයටම අසරණ වෙන තැනට ඇද දමන්නෙ? පාසල් යන්න බැරි, නීත්‍යානුකූලව රැකියාවක් කරන්න බැරි, ඉඩකඩම්වලට උරුමකම් කියන්න, සංචාරය කරන්න අයිතියක් නැති පුද්ගලයෙක්, ස්වාධීන ස්වයංපෝෂිත ජීවිතයක් ගත කරන්න අවස්ථාවක් නොලැබුණු කෙනෙක් අවසානයේදී අනිවාර්යයයෙන්ම ඕනෑම රජයකට බරක් වෙනවා නේද? ඉතින් රාජ්‍යයන් තව දුරටත් තමන්ගේ දේශ සීමාව තුළ ජීවත් වන මහා ජනකායක් මේ අනවශ්‍ය අගතියට ලක් කරන්නේ ඇයි?

මට කොහෙත්ම හිත එකඟ කරගන්න බැරි වුණු කාරණය ඒකයි.

ඉතින්, මට රටක් නැතිකම ගැන නාට්‍යයක් ලියන්න කියලා ආරාධනා කළාම  මම මේ කාරණය ගැන වැඩි අවධානයක් යොමු කරන්න හිතුවා. දක්ෂ තරුණ දරුවකුගේ දක්ෂතාවය අපතේ යන හැටි, (මේ නාට්‍යයට අනුව දක්ෂ පුංචි ගැහැනු දරුවෙක්) පුරවැසිභාවය නැති වීම කියන හේතුව නිසා ස්වාධීනව පවතින්න ඉඩක් නොලැබෙන හැටි මෙයින් පෙන්වනවා. මේ චරිතය ඇය ළමා කාලයේ ඉඳන්ම දිනාගත් සහතික, ඇය ක්‍රීඩාවට, කලාවට, විවිධ ජීවන නිපුණතාවලට දිනාගත් සහතික තොගය ගොනු කරපු ලිපි ගොනුවක් ගෙනියනවා. නමුත් ඇය ඉපදුණු බව, පුරවැසියෙක් බව, ඇය ජීවත්ව සිටින බව සහතික කරන සහතිකය ඒ අතර නැති නිසා, අනිත් සහතික කිසිවක් වලංගු නැහැ.

මටත් පුංචි දුවලා දෙන්නෙක් ඉන්නවා. මේ පිටපත ලියන අතරේ මම ඔවුන් ඔවුන්ම වෙලා, ඔවුන්ට පුරවැසිභාවය විතරක් උරුම නොවී තිබුණා නම්- මගේ දරුවන්ට දැනෙන හැඟීම හිතින් මවාගන්න උත්සාහ කළා. මම ලෝකය පුරාම විසිරිලා ඉන්න රටක් නැති දරුවන් ගැන කතා, විස්තර, කියවලා තියෙනවා. ඒ හැම දරුවකු තුළම තියෙන සුවිශේෂී කුසලතා මම නිරීක්ෂණය කරලා තියෙනවා වගේම ඒවා නිකරුණේ අපතේ යන බවත් මම දන්නවා. මොකද ඔවුන් වැඩිහිටියන් හැටියට යථාර්ථයට මුහුණදෙද්දී ඔවුන්ගේ දරා ගැනීමේ හැකියාව, ආත්ම ශක්තිය වැඩිදියුණු වෙනවා වෙනුවට ළමා වියේදී ගොඩනගා ගත් ආත්ම විශ්වාසය බිඳ වැටිලා, අසරණ, හුදෙකලා වුණු, ආවේගශීලී පිරිසක් බවට පත් වෙනවා. එහෙම නොවී කොහොමද? තරුණ කෙනෙකුට ඊට වඩා සිත කලකිරවන දෙයක් තියෙන්න පුළුවන්ද?

මට මේ නාට්‍යය හරහා සමාජයට පෙන්වන්න ඕන වුණේ ඒ චිත්‍රය, මේ කතන්දරය. ඒ රූපය මිනිස්සු සිතේ රඳවාගන්නවා දකින්නයි මට වුවමනා වුණේ. ළාබාල, උද්‍යෝගිමත්, අපේක්ෂාසහගත ජීවිතයකට ඉදිරියට ගලායන්න තිබෙන ඉඩ අහුරන හැටි. පුංචි දරුවෙක් වැඩිහිටියෝ ඉන්න සභාවකින්, බොහොම සරල භාෂාවෙන්, ඔවුන් නිර්මාණය කරපු යාන්ත්‍රණ, ඇගේ පැවැත්ම පිළිනොගන්නේ ඇයි කියලා ප්‍රශ්න කරනවා.

මේ නාට්‍යයක් විතරක් වුණා නම්, යථාර්ථය නොවුණා නම්, මිලියන ගණනක් දරුවන්ගේ ඛේදනීය ඉරණම නොවුණා නම්, කියලා මට හිතුණු වාර ගණන අනන්තයි.

# THE CERTIFICATE වෙත හිමිවුණු ප්‍රතිචාර

*මේ නාට්‍යය බිහිකිරීමට මුල් වුණු අය, නාට්‍යයට රංගනයෙන් දායක වුණු අය සහ නාට්‍යය නරඹපු අය දක්වපු අදහස්වලට සවන්දෙමු.*

මේ නාට්‍යය බිහිවීමට පුරෝගාමී වුණේ Institute on Statelessness and Inclusion ආයතනයයි. ඒ රටක් නැති දරුවන්ගේ ගැටලුවලට විසඳුම් සැපයීම වෙනුවෙන් ඔවුන් ආරම්භ කළ වැඩසටහනේ අංගයක් හැටියටයි.

***මේ නාට්‍යය සහ රටක් නැතිකම කියන පුළුල් සමාජ ගැටලුව අතර ඇති සබඳතාව ගැන අමල් දැක්වූ අදහස්***

මේ නාට්‍යය සඳහා වැඩියෙන්ම රංගනයෙන් දායක වුණේ ශාලිනා මුතුමුදලිගේ කියන යොවුන් රංගන ශිල්පිනිය. ඇය මීට මුල්ම වරට සම්බන්ධ වුණේ වයස අවුරුදු පහළොවේදී. මීට කලින් ශාලිනා රටක් නැතිකම පිළිබඳව කිසිවක් දැන සිටියේ නැහැ.

***මේ චරිතය රඟදැක්වීම හරහා රටක් නැතිකම ගැන ඇය ලබාගත් අත්දැකීම ශාලිනා විස්තර කරයි. මේ ගමන ඇයට දැනුනේ කොහොමද?***

මේ නාට්‍යයෙන් කියවෙන්නේ රටක් නැති අම්මා කෙනෙකුගේ දරුවෙක් වීම නිසා රටක් නැති තත්වයට පත් වෙන දක්ෂ, පුංචි ගැහැණු දරුවෙක් ගැන. දීප්ති ගුරුන්ග් වසර ගණනාවක් ගෙවෙනතුරු තමන්ටත්, තමන්ගේ දූවරුන්ටත් පුරවැසිකම ලබාගන්න මහා සටනක් කරපු නේපාල ජාතික මවක්. මේ නාට්‍යය හරහාත් එක්තරා විදියකින් කියවෙන්නේ ඇගේම ජීවිත කතාව.

***දීප්ති මේ නාට්‍යයෙන් සාකච්ඡාවට ලක් කරන ගැටලු ගැනත්, රටක් නැති වීමේ අත්දැකීම මේ හරහා ඉස්මතු කර ඇති ආකාරය ගැනත් පළකළ අදහස්.***



# මැදිහත්වීමක්

## සමාජ ක්‍රියාකාරීත්වය සහ කලාව

# කලාව හා සමාජ ක්‍රියාකාරීත්වය අතර තිබෙන සම්බන්ධය

*The Certificate* බිහිවුණේ රඟදක්වා පෙන්වන ඒකභාෂික නාට්‍යයක් හැටියට වුණත් එය වෙනස්ම දෙයක් දක්වා විකාශය වුණා. එය අතරමැදදී කරන බාධා කිරීමක්, ප්‍රේක්ෂකාගාරය නොසන්සුන් කරවන වෙනස් විදියේ අත්දැකීමක් බවට පත්වුණා.

කලාව මේ ආකාරයෙන් යොදාගැනීම ක්‍රියාකාරීන්ගේ කලාව, දේශපාලනික කලාව සහ විරෝධාකල්පී කලාව නමිනුත් හැඳින්වෙනවා. ඒ වචනවලින් කියවෙන සරල අදහස සමාජ හෝ දේශපාලනික ගැටලුවක් පිළිබඳව ක්‍රියාකාරීව මැදිහත් වීමට ප්‍රේක්ෂකාගාරය මෙහෙයවීම සඳහා කලාව යොදාගැනීමයි. මේ මූලාශ්‍ර හරහා ඔබට කලාව සහ ක්‍රියාකාරීත්වය ගැන වැඩිදුරටත් හදාරන්න පුළුවන්.

අධ්‍යයන ගොනුවේ මේ පරිච්ඡේදයෙන් අපි *The Certificate* කලා කෘතියක සිට සමාජ ක්‍රියාකාරීත්වය වෙත ප්‍රේක්ෂකයන් පොළඹවන නිර්මාණයක් දක්වා විකාශය වුණු හැටි විමසා බලමු. රටක් නැති කමේ ගැටලුවට සමාජයේ අවධානය යොමු කිරීමට කලාව යොදාගන්නා ආකාරයත් අපි මෙයින් විමසා බලමු.



**ශාලිනා මුතුමුදලිගේ**
*The Certificate නාට්‍යයේ රඟදැක්වීමක්*

# THE CERTIFICATE – රංගයක සිට බාධා කිරීමක් දක්වා

*The Certificate බිහිවුණේ රඟදක්වා පෙන්වන ඒක භාෂික නාට්‍යයක් හැටියට වුණත් එය පසුකාලීනව වඩාත් පුළුල්, විප්ලවීය නිර්මාණයක් බවට පත් වුණා. මේ කියන්න යන්නේ එය අතරමැද බාධා කිරීමක්, අත්දැකීමක්, ක්‍රියාකාරීත්වය වෙත ප්‍රවේශයක් ලෙස තම අනන්‍යතාවය ගොඩනගාගත් ආකාරයයි.*



කාදිජා බද්‍රී *The Certificate* නාට්‍යයේ රඟදැක්වීමක්
empathyandrisk.com

# පළමුවන ඉදිරිපත් කිරීම : කියවීමක් ලෙසින්
ISI Book Launch (London 2017)

*The Certificate* නාට්‍යයේ ආරම්භය බෙහෙවින්ම චාම්,සරල එකක්. ඒ ලන්ඩන් නුවරදී පැවැත්වුණු, රටක් නැතිකම ගැන ලියවුනු පොතක් එළිදැක්වීමේ උළෙලක් වෙනුවෙන්. මේ නාට්‍යය සඳහා කිසිම අයවැයක් වෙන් කර නොතිබුණු නිසා කාදිජා බද්‍රී කියන විශ්වවිද්‍යාල ශිෂ්‍ය ක්‍රියාකාරිනිය පිටපත කියවීමට ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වුණා.

කදිජා වෙදිකාව මත ඒරමිණියා ගොතාගෙන පිටපත කියෙව්වා. කදිජාගේ ස්වාභාවික ඉදිරිපත් කිරීම සාර්ථක වුණා. මේ නාට්‍යය වඩාත්ම සාර්ථක එය "රඟපෑමක්" නොවන තරමට බව එයින් පැහැදිලි වුණා.




**ශාලිනා මුතුමුදලිගේ**
*The Certificate නාට්‍යයේ රඟදැක්වීමක්*
*UNHCR හිදී*

# දෙවන ඉදිරිපත් කිරීම : රඟදැක්වීමක් ලෙසින්
## UNHCR World Refugee Day (Colombo 2017)

ඊළඟ වතාවේ නාට්‍යය ඉදිරිපත් කළේ ලංකාවෙදි; ඒ එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයේ අනුග්‍රහයෙන්. පහළොස් හැවිරිදි ශාලිනා මුතුමුදලිගේ ටී ෂර්ට් එකකින් සහ කොට කලිසමකින් සැරසී, වේදිකාව මත තිබුණු මේසයක් මත වාඩි වෙලා බොහොම සැහැල්ලුවෙන් ප්‍රේක්ෂකාගාරයට ආමන්ත්‍රණය කළා.

පුංචි දැරිවියක් කාටවත් හරිහමන් උත්තරයක් දෙන්න බැරි සංකීර්ණ, බරපතල ප්‍රශ්න වැඩිහිටියන් පිරිසකට ඉදිරිපත් කිරීමෙන් ඇති වුණු බලපෑම ඉතාමත් ප්‍රබලයි. නමුත් මේ නාට්‍යය හුදු රඟදැක්වීමකින් ඔබ්බට ගොස් අතරමැද බාධා කිරීමක් හැටියට ඉදිරිපත් කිරීම ඒ අවස්ථාවේදීත් නිසි ආකාරයෙන් සිද්ධ වුණේ නැහැ.




*The Certificate හේග් හිදී*

# තුන්වන ඉදිරිපත්කිරීම : බාධාකිරීමක් ලෙසින්
## World Conference on Statelessness (The Hague 2019)

The Certificate නාට්‍යයට ඊළඟ ප්‍රදර්ශන අවස්ථාව හිමිවුණේ හේග් නුවර පැවැත්වුණු රටක් නැතිකම පිළිබඳ පළමුවෙනි ලෝක සමුළුවට සමගාමීව සංවිධානය කෙරුණු CANCELLED කලා උළෙලේදී.

ඉහළ රාජ්‍ය නිලධාරීන්, තානාපතාවරු, සමාජ ක්‍රියාකාරීන් සහ විද්‍යාර්ථීන් රැසක් සහභාගී වූ සමාරම්භක උළෙලේදී ආරාධිත කථික රාදිකා කුමාරස්වාමිගේ මූලාසන කතාවෙන් පසුව, ප්‍රශ්නෝත්තර වටයේදී *The Certificate* ඉදිරිපත් කෙරුණේ පෙර දැනුම් දීමකින් තොරව, උත්සවයේ කටයුතුවලට බාධා වෙන අයුරින්. මෙවර ඉදිරිපත්කිරීම මොන තරම් සාර්ථකද කියනවා නම් ඒ රඟදැක්වීමෙන් පසුවත් සමහරු විශ්වාස කළේ මේ ඇත්තටම මේ සභාව ඉදිරියේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න මග පාදාගත්තු රටක් අහිමි දරුවෙක් කියලයි.

# බාධා කිරීමක් ලෙස THE CERTIFICATE ඉදිරිපත් කිරීම ගැන පළ වූ අදහස්

රටක් නැතිකම පිළිබඳ ලෝක සමුළුවේ සමාරම්භක උළෙලේදී ඇයගේ මූලාසන කතාවෙන් පසුව ශාලිනා කළ ඉදිරිපත් කිරීම ගැන රාධිකා කුමාරස්වාමි පළකළ අදහස්.



*" පසුගිය වසර පහළොවකට ආසන්න කාල සීමාවේදී මම එකසත් ජාතීන්ගේ සංවිධානයේ වැදගත් ධූරයන් කිහිපයක්ම දැරුවා. මම එය නොසලකා හරින්න උත්සහ කළත් සාමාන්‍යයෙන් මට විශාල ගෞරවයක් සහ පිළිගැනීමක් හිමි වෙනවා. ඉතින් මගේ කතාව අවසානයේදී මේ පුංචි ගැහැණු දරුවා නැගිටලා ඔවුන් මුහුණදෙන සැබෑ තත්වය සහ අපි මොනතරම් අසාර්ථකද කියලා පෙන්වලා මගේ කතාවට අභියෝග කළාම මම තිගැස්සුණා. ඇය වේදිකාවට නගිනකම්ම මම එය රඟපෑමක් බව දැනගෙන හිටියෙ නැහැ. නමුත් සුළු මොහොතකට හරි ඇය අපව ආපස්සට හිතන්න පෙළඹෙව්වා.*

*ඇයගේ උද්‍යෝගය අපිව වසඟ කළා. ඒ සාමාන්‍යයෙන් සම්මන්ත්‍රණ ශාලාවලදි ඇහෙන හඬක් නෙවෙයි. මෙයම තමයි කලාවේ අරමුණ විය යුත්තේ- අපිට අභියෝග කරමින් ලෝකය දෙස වෙනස් කෝණයකින් බලන්න අපිව පෙළඹවීමයි. "*

**රාධිකා කුමාරස්වාමි**
එක්සත් ජාතීන්ගේ හිටපු උපලේකම් සහ සන්නද්ධ ගැටුම් සහ ළමුන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත

රටක් නැතිකම පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේදී *The Certificate* නැරඹූ දීප්ති ගුරුන්ග් දැක්වූ අදහස්



*" ශාලීනාගේ රඟදැක්වීම රඟපෑමක් නෙවෙයි. එයින් කියවුණේ මහා සෙනඟක් විඳින දුක ගැන. මම එය නරඹද්දී දැනුණේ මගේ ආත්මයට උණු කරපු යකඩ වත් කරලා ඒවා මගේ ඇස්වලින් උතුරා ගලා යනවා වගේ.*

*මම දිනපතාම වගේ රටක් නැති දරු පවුල් මුණගැසුණත් මට ඔවුන් විඳින වේදනාවට ඔරොත්තු දීමේ හැකියාවක් නැහැ. මට පුළුවන්කමක් තිබුණා නම් ඔවුන්ගේ හඬ මල්ලක අසුරලා මුලු ලෝකයම හමුවේ දිගහරිනවා.*

*ශාලීනා ලිපි ගොනු, ලියකියවිලි උස්සාගෙන ඇවිත් අත උස්සලා ප්‍රශ්නය ඉදිරිපත් කළ මොහොතේ මගේ හදවත හඬාවැටුණා. මට තදින්ම දැනුණේ මෙය ප්‍රතිපත්ති සම්පාදකයන්ට පණිවුඩයක් ලබාදෙන්න සාර්ථක මාධ්‍යයක් බවයි. එක්සත් ජාතීන්ගේ මහා සමුළුවේදිත් මෙය ඉදිරිපත් කරන්න ඔබට අවස්ථාවක් ලැබේවා කියලයි අපි ප්‍රාර්ථනා කරන්නෙ. "*

**දීප්ති ගුරුං**
නේපාලය
රටක් නැති අයගේ අයිතීන් වෙනුවෙන් පෙනී
සිටින ක්‍රියාකාරිනියක්

***The Certificate ඉදිරිපත් කරමින් රටක් නැතිකම පිළිබඳ ලෝක සමුළුවේ සමාරම්භක උළෙලට බාධා කිරීමේ අත්දැකීම ගැන යොවුන් නිළිය පළකළ අදහස්වලට සවන්දෙන්න***

# රටක් නැතිකමේ ගැටලුව සම්බන්ධයෙන් ක්‍රියාකාරී වූ කලාකරුවන්

CANCELLED කලා උළෙල සංවිධානය කළේ රටක් නැතිකම පිළිබඳ ලෝක සමුළුවට සමගාමීවයි. රටක් නැතිකම තේමාව කරගත්, කලාකරුවන් 70 දෙනෙකුගේ නිර්මාණ මෙහිදී ප්‍රදර්ශනය කෙරුණා. මේ කලා උළෙල කලාකරුවන්ගේ නිර්මාණ හරහා විටෙන සමුළුව අගයමින්, විටක එයට අභියෝග කරමින් සමුළුවට අනුබද්ධව පැවැත්වුණා.

මේ යොමුවෙන් රටක් නැතිකම පිළිබඳ ජාත්‍යන්තර සමුළුවට සමගාමීව පැවැත්වුණු CANCELLED කලා උළෙලේ වීඩියෝ පටය නරඹන්න.

රටක් නැතිකම ගැන ක්‍රියාකාරීව වැඩ කරන කලාකරුවන් විශාල පිරිසක් ඉන්නවා. සමහරු නාට්‍යවේදීන්, සමහරු දෘෂ්‍ය කලා ක්ෂේත්‍රයේ අය, තවත් සමහරු ඡායාරූප ශිල්පීන්.

- Jonas Staal සහ New World Summit
- Saiful Huq Omi වසර ගණනක් තිස්සේ රෝහිංන්යා ප්‍රජාව ගැන වාර්තා චිත්‍රපට නිපදවනවා.
- Greg Constantine රටක් නැතිකමේ ගැටලුව ගැන කතාබස් කරනවා වගේම ඡායාරූපයට නංවනවා.

*ආයතනය රටක් නැතිකමේ ගැටලුවට විසඳුම් සෙවීමේදී කලාකරුවන් සමග සමීපව කටයුතු කරනවා. ඔවුන් මේ සඳහා පෙළඹුණේ ඇයි කියලා තව දුරටත් දැනගන්න.*

මේ අධ්‍යයන ගොනුව කියවන්න කාලය වැය කළාට බොහොම ස්තුතියි. මේ හරහා ඔබට රටක් නැතිකමේ ගැටලුව ගැන යම් අවබෝධයකුත්, රඟදැක්වීමක් හරහා ඇති කරන්න පුළුවන් අවස්ථා ගැන වැටහීමකුත් ලැබෙන්න ඇති කියලා අපි අපේක්ෂා කරනවා. පුංචිම පුංචි රඟදැක්වීමකට වුණත්, පුංචි දරුවෙකුගේ ඉදිරිපත් කිරීමකට වුණත්, ලොකු වෙනසක් කරන්න පුළුවන්.



© ස්ටේජස් තියටර් ගැරන්ටී ලිමිටඩ්, 2020

මෙම අධ්‍යයන ගොනුව ස්ටේජස් නාට්‍ය කණ්ඩායමේ ‘Artist Research - Archiving and Documentation’ නම් ව්‍යාපෘතියේ කොටසක් ලෙස සම්පාදනය වූවකි.

ස්ටේජස් නාට්‍ය කණ්ඩායම වසර දහයක් පුරාවට කළ නිෂ්පාදන ක්‍රියාවලීන් විශ්ලේෂණය හරහා කලා භාවිතයේ නියුතු කලා ශිල්පීන් ඔවුන්ගේම නිර්මාණයන් ක්‍රමවත් හා විචාරාත්මක විශ්ලේෂණයට භාජනය කිරීම මෙම ව්‍යාපෘතිය හරහා සිදුවිය. මේ දශකය නම් ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය නිම වූ වසරේ සිට එළැඹි දස වසරයි (2009 සිට 2019 දක්වා).

ප්‍රකාශනයට පත්කිරීමේ අටියෙන් මෙවැනි අධ්‍යයන ගොනු දාසයක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාවන්ගෙන් නිම විය. කලා ශිල්පීන් විසින් පර්යේෂණකොට රචනා කරන ලද මේ සෑම අධ්‍යයන ගොනුවක්ම මෙම නිෂ්පාදන බිහි වූ සමාජ-දේශපාලනික සන්දර්භ වටපිටාවන් විභාග කරන අතර එම ක්‍රියාවලීන් තුළදී කරනා ලද නිර්මාණාත්මක තීරණ විශ්ලේෂණය කරයි. මේ ප්‍රයත්නයේම අංගයක් ලෙස ඊට සමගාමී වීඩියෝපට මාලාවක්ද නිර්මාණය කරන ලදී. මෙම පර්යේෂණ ව්‍යාපෘතිය හරහා නිෂ්පාදනය කරන ලද සියලුම සම්පත් www.stages.lk වෙබ් අඩවිය හරහා ඔබට ලබාගත හැක.

## අධ්‍යයන ගොනු

**සංස්කරණය (ලිඛිත):** රුවන්ති ද චිකේරා

**සංස්කරණය (වීඩියෝ):** මලිත් සුලාර

**භාෂා සංස්කරණය:** නිපුනි ශාරදා පතිරගේ (සිං), කිං රත්නම් (දෙ)

**රචනය:** රුවන්ති ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු, ජයම්පති ගුරුගේ, නදී කම්මැල්ලවීර, නිපුනි ශාරදා පතිරගේ, පියුමි විජේසුන්දර, නලින් ලුසේනා

**පිටු සැලසුම්:** මල්ෂානි දෙල්ගහපිටිය, රජිත පවිත්‍ර මධුභාෂ

**සෝදුපත් බැලීම සහ භාෂා සංස්කරණය:** ආශා අබේකෝන්, ගිහාන් ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු, යු.ඩි.ආර්.එච්.කේ.ගුණසිංහ, ට්‍රෙසි හොල්සින්ගර්, අරවින්ද ජයසේකර, නදී කම්මැල්ලවීර, නිපුනි ශාරදා පතිරගේ, සුදේශ්නා රන්මුතුගල, කිං රත්නම්, තිලකා සුභසිංහ.

**සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ:** ප්‍රසාද් අලුත්වත්ත, ඩේවිඩ් කොටරල්, සංජය එක්නැළිගොඩ, රජිත පවිත්‍ර මධුභාෂ, වෙනුර නවෝද්, දෙශාන් තෙන්නකෝන්

**සැලසුම් සහය:** කියාස් අහමඩ්, මල්ෂානි දෙල්ගහපිටිය, ජනිත් හර්ශන.

**පර්යේෂණ සහය:** කෞෂල්‍යා ආටිගල, නලින් ලුසේනා, රජිත පවිත්‍ර මධුභාෂ, අකලංක ප්‍රභාශ්වර, දිනුෂිකා සෙනෙවිරත්න

**පරිවර්තනය:** හිරණ්‍යදා දේවසිරි (සිං/ඉං), අරුන්දි ජයසේකර (සිං/ඉං), මනුලි ලවන්‍යා (සිං/ඉං), ලිහිණි නිලවීර (සිං/ඉං), ජීනාදනී පරමේශ්වරම් (දෙ), ශාමලා වේදනායගම් (දෙ), පියුමි විජේසුන්දර (ඉං), හිමංසි දෙහිගම (සි)

**කැමරාකරණය:** වෙනුර නවෝද්, කිං රත්නම්, ප්‍රමිල සමරකෝන්, කසුන් උක්වත්ත

**වෙබ් අඩවි නිර්මාණය:** රන්සක ගල්මන්ගොඩ

**කළමනාකරණය:** මල්ෂානි දෙල්ගහපිටිය, මහේෂ් ලක්මාල්

**ස්ටේජස් නාට්‍ය කණ්ඩායම**
**අධ්‍යයන ගොනු**

**DCS දශක හතක ශ්‍රී ලංකාව**
රචනය : රුවන්ති දි චිකේරා, නිපුනි ශාරදා පතිරගේ
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**DCS Girls at Checkpoints**
රචනය : පියුමි විජේසුන්දර
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**DCS ස්වයංකථන**
රචනය : රුවන්ති ද චිකේරා
සහය: පෙමන්ති ප්‍රනාන්දු
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**DCS රුවන්ඩා - ශ්‍රී ලංකා සහයෝගීත්ව නිර්මාණය**
රචනය : නිපුනි ශාරදා පතිරගේ
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ග්‍රීස් යකා**
රචනය: රුවන්ති ද චිකේරා, පෙමන්ති ප්‍රනාන්දු
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**කලුමාලි : වැඩිහිටියන්ට සුරංගනා කතාවක්**
රචනය: රුවන්ති දි චිකේරා, නදී කම්මැල්ලවීර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**Love and Other Objects**
රචනය: ජයම්පති ගුරුගේ
සහය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**Ovaryacting !**
රචනය : පියුමි විජේසුන්දර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: වෙනුර නවෝද්

**Passing Stage ව්‍යාපෘතිය**
රචනය: රුවන්ති ද චිකේරා
සහය: කෞෂල්‍යා ආටිගල, රජිත පවිත්‍ර මධුභාෂ
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: සංජය එක්නැළිගොඩ, රජිත පවිත්‍ර මධුභාෂ

**සිරියානු ස්වයංකථන**
රචනය: ජයම්පති ගුරුගේ
සහය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: දෙශාන් තෙන්නකෝන්

**The Certificate**
රචනය: රුවන්ති ද චිකේරා
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: සංජය එක්නැළිගොඩ

**Thought Curfew**
රචනය: පියුම් විජේසුන්දර
සහය: අකලංක ප්‍රභාශ්වර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ඬේවිඩ් කොටරල්

**Walking Path - වචන නැති නාට්‍යයක්**
රචනය: ජයම්පති ගුරුගේ
සහය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ස්ටේජස් කලා ශිල්පී පුහුණු වැඩමුළුව**
රචනය: නලින් ලුසේනා
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**Stages Junior Ensemble**
රචනය: පියුම් විජේසුන්දර
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

**ස්ටේජස් ජ්‍යෙෂ්ඨ වෘන්ද පාඨමාලාව**
රචනය: ජයම්පති ගුරුගේ
සැලසුම් සහ ග්‍රැෆික් නිර්මාණ: ප්‍රසාද් අලුත්වත්ත

stages
theatre
group